තාවකාලික හෝ දීර්ඝකාලීන හෝ ස්ථිර ආබාධ සහිතව ජීවත් වන මිනිසුන් ප්‍රමාණය සමස්ත ලෝක ජනගහණයෙන් 15% ක පමණ ප්‍රමාණයක්ය යන්න සැලකූ විට, ඔවුන්ව කිසිසේත්ම කොන් කිරීමකට ලක් නොවීම හෝ ඔවුන් වෙනස් ආකාරයෙන් සැලකීමකට ලක් නොවීම අනිවාර්ය කාරණයක් වේ. එහිදී ඔවුන් සම්බන්ධයෙන් සඳහන් කෙරෙනා භාෂාවද මූලික තැනක් ගනී. එහිදී පුද්ගල-මූලික භාෂාවක් (Person-first language) භාවිතා කිරීම වඩාත් යෝග්‍ය බවට සංවාදයන් ලෝකයේ සිදුවෙමින් පවතී.

පුද්ගල-මූලික භාෂාවක ප්‍රධාන අදහස වන්නේ, ආබාධය හෝ තත්වය පිළිබඳව සඳහන් කිරීමට පෙරාතුව, එම පුද්ගලයාව ප්‍රමුඛ කොට පිළිගැනීමයි. උදාහරණයක් ලෙසින් ගත් විට, Disabled person වැනි යෙදුමක් වෙනුවට Person with a disability යන්න යොදාගැනීම දැක්විය හැක.

මේ සඳහා යෙදෙන සිංහල යෙදුම් සැලකිල්ලට ගත් විට, 'ආබාධිත' යන්න වෙනුවට 'ආබාධ සහිත' යන යෙදුම වඩාත් යෝග්‍ය නොවේ දැයි අපට ඇසිය හැක. මන්දයත්, 'ආබාධිත' යන්නෙන් අදාළ පුද්ගලයාව එම ආබාධය ඔස්සේ, ආබාධය ප්‍රාථමික කොට ගනිමින් හැඳින්වීමත්, 'ආබාධයක් සහිත පුද්ගලයා' යන්නෙන් එම ආබාධය ද්විතීයික කාරණාවක් ලෙසින් ගනිමින් පුද්ගලයාව මූලික කොට ගනිමින් හැඳින්වීමත් සිදුවන හෙයිනි.

පහත දැක්වෙන ආකාරයේ ධනාත්මක සහ දිරිගැන්වීමේ පණිවුඩයක් සමාජයට ලබාදෙන පුවත් වාර්තාවන් තුළදී වුවත්, පුද්ගල මූලික භාෂාවක් භාවිතා කිරීම වැදගත් වන්නේ ඒ හෙයිනි.

මූලාශ්‍ර:

https://www.who.int/.../fact.../detail/disability-and-health
http://www.disability.wa.gov.au/.../words_that_work_media...
https://adata.org/factsheet/ADANN-writing
https://lagunashoresrecovery.com/what-is-person-first.../

#MediaEthicsSL #lka #SinhalaPress #Dinamina #Mawbima #Aruna